268120

ලකුණු කිරීමේ පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

11 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## බුද්ධ ධර්මය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සුදොවුන් රජතුමා සිදුහත් කුමාරයා හට සෘතු තුනට අනුරූපීව වාසය කිරීමට මාලිගා තුනක් සාදවා දීමෙන් බලාපොරොත්තු වූ අරමුණු අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) සක්විති රජකු වීමේ අපේක්ෂාවට බාධා ඇති නොකිරීම ය.
(2) ගෘහ ජීවිතයට වන බාධා මගහැරවීම ය.
(3) කාමභෝගී ජීවිතයකට සුදුසු ඒකායන මග පෙන්වාදීම ය.
(4) මාලිගාවෙන් පිටත ලෝකය යථාර්ථය බව අවබෝධ කරවීම ය.

**2.** ජීවිතයේ සාර්ථකත්වය සඳහා එළඹෙන අභියෝග ජයගත යුතු අතර ක්ෂණික තීරණ නොගෙන හොඳින් සිතා විමසා බලා ක්‍රියා කළ යුතු ය. මේ සඳහා සිදුහත් බෝසතාණන්ගේ චරිතයෙන් සපයන ආදර්ශය වන්නේ,
(1) කිං කුසලගවේසී වීම යන්න ය. (2) පංච මහාවිලෝකනය යන්න ය.
(3) සිංහාවලෝකනය යන්න ය. (4) අභිනිෂ්ක්‍රමණය කිරීම යන්න ය.

**3.** පන්සාළිස් වසක් වූ බුදු සිරිතේ මූලික ප්‍රත්‍ය පහසුකම් **නොලැබුණු** දුෂ්කර කාලසීමාවක් වන්නේ,
(1) පාරිලෙය්‍ය වනයේ වැඩ විසූ කාලයයි. (2) වේරංජාවේ වැඩ විසූ කාලයයි.
(3) උරුවේලාවේ වැඩ විසූ කාලයයි. (4) භේෂකලා පර්වතයෙහි වැඩ විසූ කාලයයි.

**4.** බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව ශ්‍රේෂ්ඨ බව ය. ඉන් ප්‍රකට වන්නේ,
(1) ආමිස පූජාව මෙන්ම ප්‍රතිපත්ති පූජාව ද සමාන බව ය.
(2) දන් පහන් දීම නුසුදුසු බව ය.
(3) ධර්මානුකූලව ජීවත්වීම වඩා ශ්‍රේෂ්ඨ බව ය.
(4) ප්‍රතිපත්ති පූජාව පමණක් අනුමත කර ඇති බව ය.

**5.** තෙරුවන් සරණ යාම දෙවියකුගේ, බ්‍රහ්මයකුගේ හා මැවුම්කරුවකුගේ පිහිට පැතීමට වඩා වෙනස් වන්නේ එහි පදනම,
(1) ශ්‍රද්ධාව වන බැවිනි. (2) සීලය වන බැවිනි.
(3) භක්තිය වන බැවිනි. (4) විශ්වාසය වන බැවිනි.

**6.** "මා නිරෝගීව සිටියදී රෝගී වූ භික්ෂූන් වෙත උපස්ථානයට නොගිය බැවින් මා රෝගී අවස්ථාවේදී කිසිවෙකුත් පැමිණියේ නැත." මෙසේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දෙනු ලැබුයේ,
(1) මුළු සිරුරම වණ වී සිටි තෙරුන් විසිනි. (2) ඇස් අන්ධ වී සිටි තෙරුන් විසිනි.
(3) රෝගීව පිප්ඵලී ගුහාවේ සිටි තෙරුන් විසිනි. (4) දරුණු උදරාබාධයකින් පෙළුණු තෙරුන් විසිනි.

[දෙවැනි පිටුව බලන්න.

**7.** පුද්ගලයකුගේ උපතේ සිට මරණය දක්වාත් ඉන් පසුවත් නිශ්ශරණාධ්‍යාශයෙන්ම සමාජ මෙහෙවරෙහි යෙදෙන්නේ,
(1) පසේ බුදුවරයෙකි. (2) සක්විති රජෙකි.
(3) බෞද්ධ භික්ෂුවකි. (4) අනගාරික වූවෙකි.

**8.** සිද්ධාර්ථ කුමාරයා සරණ පාවාගත් භද්දකච්චානා කුමරියගේ පියාගේ නම කුමක් ද?
(1) මහානාම ශාක්‍ය රජ (2) සුප්‍රබුද්ධ ශාක්‍ය රජ
(3) අමිතෝදන ශාක්‍ය රජ (4) විඩූඩභ ශාක්‍ය රජ

**9.** "මා දෙන බතින් යැපෙන, මා සපයන යානයෙන් ගමන් යන, මා නිසා ජීවත්වන වඩුවෝ දෙදෙනා මා හට ගෞරව නොදක්වා ඔබ වහන්සේ කෙරෙහිම ගෞරව දැක්වූහ." බුදුරජාණන් වහන්සේට මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(1) කොසොල් මහරජතුමා (2) බිම්බිසාර මහරජතුමා
(3) සුද්ධෝදන මහරජතුමා (4) අජාසත් මහරජතුමා

**10.** පාරමිතා ගුණ ධර්ම පුරුදු පුහුණු කරන්නෙකු විසින් ඒවා කරුණු පහක් යටතේ සම්පූර්ණ කළ යුතු අතර ඊට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) තණ්හාවෙන් තොරව දානාදී ගුණ ධර්ම පිරීම ය.
(2) මානයෙන් තොරව දානාදී ගුණ ධර්ම පිරීම ය.
(3) මිථ්‍යාදෘෂ්ටියෙන් තොරව දානාදී ගුණ ධර්ම පිරීම ය.
(4) උපාය කෞශල්‍ය ඥානයෙන් තොරව ගුණ ධර්ම පිරීම ය.

**11.** සිවි ජාතක කථාවෙන් ප්‍රකට වන්නේ අප මහබෝසතාණන් වහන්සේ සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?
(1) වීර්ය පාරමිතාව (2) දාන පාරමිතාව
(3) මෛත්‍රී පාරමිතාව (4) උපේක්ෂා පාරමිතාව

**12.** සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ ලෙස සත්‍ය අවබෝධ කරන ආකාර තුනක් ධර්මයේ දැක්වේ. එම තුන් ආකාරය,
(1) ත්‍රිශික්ෂා නම් වේ. (2) ත්‍රිලක්ෂණ නම් වේ.
(3) ත්‍රිවිධ රත්නය නම් වේ. (4) තුන්තරා බෝධිය නම් වේ.

**13.** 'දානං ච ධම්මචරියා ච' යන ගාථාවේ දැක්වෙන මංගල කරුණු අතරට අයත් **නොවන** කරුණු ඇතුළත් වරණය කුමක් ද?
(1) දානය, ධර්මයෙහි හැසිරීම, ඥාතීන්ට සංග්‍රහ කිරීම
(2) දන්දීම, සිල් රැකීම, භාවනාවෙහි යෙදීම
(3) දානය, ධර්මයෙහි හැසිරීම, නිවැරදි කර්මාන්ත කිරීම
(4) ඥාති සංග්‍රහය, නිවැරදි කර්මාන්ත කිරීම, දහමෙහි හැසිරවීම

**14.** පුද්ගලයා එදිනෙදා කළ යුතු කාර්යයන් පසුවට කල් තබමින් උදාසීනව කටයුතු කිරීම නීවරණ ධර්මයක් ලෙස ධර්මයෙහි දැක්වේ. එම නීවරණය,
(1) විචිකිච්ඡා නම් වේ. (2) උද්ධච්ච කුක්කුච්ච නම් වේ.
(3) ථීනමිද්ධ නම් වේ. (4) ව්‍යාපාද නම් වේ.

**15.** බෞද්ධ ඉගැන්වීම අනුව චිත්ත භාවනාව වැඩීමෙන් ලැබිය හැකි ඉහළම ප්‍රතිඵලය වන්නේ,
(1) චතුර්ථධ්‍යාන සහිත සප්ත සමාපත්තියයි. (2) චතුර්ථධ්‍යාන සහිත අෂ්ට සමාපත්තියයි.
(3) පංච අභිඥා සහිත සප්ත සමාපත්තියයි. (4) පංච අභිඥා සහිත අෂ්ට සමාපත්තියයි.

**16.** නැවත නැවත මැරි මැරී ඉපදි ඉපදී සැරිසරන පුහුදුන් සත්ත්වයාගේ මතු පැවැත්ම දැකිය හැකි නුවණ හැඳින්වෙන්නේ,
(1) පුබ්බේනිවාසානුස්සති ඤාණය නමිනි. (2) සද්ධිවිධ ඤාණය නමිනි.
(3) පරචිත්තවිජානන ඤාණය නමිනි. (4) චුතූපපාත ඤාණය නමිනි.

**17.** කර්මානුරූපව පුද්ගල විෂමතා ඇතිවන ආකාරය ප්‍රකට කෙරෙන චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව ද්වේෂයෙන් කටයුතු කරන තැනැත්තා මතු භවයේ උපදින්නේ,
(1) රෝගියෙකු වී ය. (2) අඩු ආයුෂ ඇතිව ය.
(3) විරූපීව ය. (4) යසස් නැතිව ය.

**18.** සියලු කෙලෙසුන් නසා රහත්භාවයට පත් පුද්ගලයාට, කර්ම විපාකදීමට අවස්ථාවක් නොලැබී අවිපාක කර්ම බවට පත්වීම ධර්මයෙහි හැඳින්වෙන්නේ,
(1) ගරුක කර්ම ලෙස ය. (2) කටත්තා කර්ම ලෙස ය.
(3) ආචිණ්ණ කර්ම ලෙස ය. (4) අහෝසි කර්ම ලෙස ය.

[තුන්වැනි පිටුව බලන්න.

**19.** සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටුකළ යුතු යුතුකම් අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) මැනවින් හික්මවීම යන්න ය. (2) අවමන් නොකිරීම යන්න ය.
(3) මැනවින් ඉගැන්වීම යන්න ය. (4) හිතමිතුරන්ට හඳුන්වාදීම යන්න ය.

**20.** හද්දාලි සූත්‍රයේ සඳහන් වන පරිදි ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) මනා කායික ශක්තිය ලැබීම යන්නයි. (2) මනා මානසික බලය ලැබීම යන්නයි.
(3) රෝගාබාධ අඩු බව යන්නයි. (4) සුවපහසු පැවැත්ම යන්නයි.

**21.** සමථ භාවනාවෙන් ශිෂ්‍ය ජීවිතයට ගතහැකි ප්‍රයෝජන අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) මතක ශක්තිය දියුණු වීම ය. (2) එක අරමුණක සිටීමට හැකි වීම ය.
(3) වහා අවබෝධ කරගැනීමේ ශක්තිය දියුණු වීම ය. (4) සහජීවනයෙන් කටයුතු කිරීමට හැකි වීම ය.

**22.** දිය සිඳී ගිය පොකුණු තෙර පසුතැවුණු මහලු කොස්වා ලිහිණියකු මෙන් තරුණ කාලයේ මගහැරී ගිය දේ පිළිබඳ සිතමින් පසුතැවිලි නොවිය යුතු බව දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) "උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ" යන්නයි.
(2) "අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං" යන්නයි.
(3) "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති" යන්නයි.
(4) "යෝ ච වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ" යන්නයි.

**23.** රසයෙහි ගිජු වූ නාස්තිකාර ස්ත්‍රියක හෝ පුරුෂයකු ගෘහ ආධිපත්‍යයෙහි තැබීම පිරිහීමට හේතුවක් වන බව දේශනා කරනු ලැබ ඇත්තේ,
(1) වසල සූත්‍රයේ ය. (2) මංගල සූත්‍රයේ ය.
(3) පරාභව සූත්‍රයේ ය. (4) සිගාලෝවාද සූත්‍රයේ ය.

**24.** සමාජයක ඉතා වැදගත් තැනක් ගන්නා කාන්තාවට විශේෂ ආරක්ෂාවක් සපයමින් ඔවුන්ගේ අභිවෘද්ධි සැලසීම රාජ්‍ය පාලකයාගේ වගකීමක් බව අවධාරණය වන බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්මය වන්නේ,
(1) සතර සංග්‍රහ වස්තුවයි. (2) දස රාජ ධර්මයයි.
(3) සප්ත අපරිහානිය ධර්මයයි. (4) සතර බ්‍රහ්ම විහරණයයි.

**25.** සතර ආකාර කර්ම විපාක අනුව, දෙවන ආත්මභාවයෙන් පසු නිවන් දැකීමට ප්‍රථම කවර හෝ භවයක විපාක දීමට ඉදිරිපත් වන කර්ම හැඳින්වෙන්නේ,
(1) උපපජ්ජවේදනීය කර්ම ලෙස ය. (2) උපත්ථම්භක කර්ම ලෙස ය.
(3) අපරාපරියවේදනීය කර්ම ලෙස ය. (4) ආචිණ්ණ කර්ම ලෙස ය.

**26.** පැමිණෙන දුක් කම්කටොලු සියල්ල කර්මයට පවරා නොදී ප්‍රඥාවෙන්, අධිෂ්ඨානයෙන් හා උත්සාහයෙන් ජය ගැනීමට ඉවහල් වන්නේ,
(1) උපධි සම්පත්තියයි. (2) ප්‍රයෝග සම්පත්තියයි.
(3) කාල සම්පත්තියයි. (4) ගති සම්පත්තියයි.

**27.** අටුවා ග්‍රන්ථවල සම්මා දිට්ඨිය පස් ආකාරයකින් විස්තර කොට ඇති අතර සෝවාන් ආදී මාර්ග සිත්වල පහළ වන සිව්සස් අවබෝධ කරගන්නා දැක්ම හඳුන්වන්නේ,
(1) ධ්‍යාන සම්මා දිට්ඨී ලෙස ය. (2) විදර්ශනා සම්මා දිට්ඨී ලෙස ය.
(3) මාර්ග සම්මා දිට්ඨී ලෙස ය. (4) ඵල සම්මා දිට්ඨී ලෙස ය.

**28.** අවෙච්චප්පසාද යනුවෙන් ධර්මයෙහි විස්තර වන පදයෙහි අර්ථය වන්නේ,
(1) බුදුරජාණන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණ දැක ඇති වන පැහැදීමයි.
(2) ත්‍රිවිධ රත්නයෙහි ඇති ගුණ හැඳින ඇති කරගන්නා පැහැදීමයි.
(3) ධර්මය අසා ක්ෂණිකව ඇති වන පැහැදීමයි.
(4) අවස්ථාවෝචිතව ඇති කරගන්නා පැහැදීමයි.

**29.** සසර දුක් නැතිවන ආකාරය පහදන පටිලෝම පටිච්ච සමුප්පාදයෙහි දැක්වෙන පරිදි නැවත, "සසරට එකතු නොවීම නිසා උපතක් සිදු නොවේ" යන්න ප්‍රකාශ වන්නේ,
(1) "වේදනානිරෝධා තණ්හානිරෝධෝ" යන්නෙනි.
(2) "තණ්හානිරෝධා උපාදානනිරෝධෝ" යන්නෙනි.
(3) "උපාදානනිරෝධා භවනිරෝධෝ" යන්නෙනි.
(4) "භවනිරෝධා ජාතිනිරෝධෝ" යන්නෙනි.

[හතරවැනි පිටුව බලන්න.

**30.** මෛත්‍රිය ප්‍රගුණ කිරීමෙන් ලැබෙන ආනිසංස ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) නොමිනිසුන්ට ප්‍රිය වීම යන්න ය. (2) දේව රැකවරණය ලැබීම යන්න ය.
(3) සිහිමුලාව මිය යෑම යන්න ය. (4) මරණින් මතු බඹලොව ඉපදීම යන්න ය.

**31.** යුතුකම් හා අයිතිවාසිකම් ඉටු නොකර තම අයිතිවාසිකම් සඳහා පමණක් සටන් වදින සමාජයකට තම තමන් සතු යුතුකම් පෙන්වාදෙන සූත්‍රධර්මය වන්නේ,
(1) පරාභව සූත්‍රයයි. (2) සිගාලෝවාද සූත්‍රයයි.
(3) මංගල සූත්‍රයයි. (4) වසල සූත්‍රයයි.

**32.** බහුජාතික හා බහුආගමික සමාජයක සහජීවනයෙන් ජීවත්වීම සඳහා ඉවහල් වන කරුණු ඇතුළත් බෞද්ධ ඉගැන්වීම වන්නේ,
(1) සතර සංග්‍රහ වස්තුවයි. (2) සතර අගතියයි.
(3) සතර සෘද්ධිපාදයි. (4) සතර සතිපට්ඨානයයි.

**33.** රටක පවත්නා නීතියට අනුගතව, වරදකරුවන්ට දඬුවම් පැමිණවීමෙන් බැහැර නොවී, හිංසාකාරී ක්‍රියාවලින් තොරව රාජ්‍ය පාලනය කිරීම දස රාජධර්මවල හඳුන්වන්නේ,
(1) තපස ලෙස ය. (2) මෘදුබව ලෙස ය.
(3) අක්‍රෝධය ලෙස ය. (4) අවිහිංසාව ලෙස ය.

**34.** පළමුවන ධර්ම සංගායනාවේදී ධර්මය කටපාඩමින් පවත්වාගෙන යාමට භාණක පරම්පරාවලට පැවරුණු අතර සංයුත්ත නිකාය කටපාඩමින් පවත්වාගෙන යාමට පවරනු ලැබුයේ,
(1) ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(2) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(3) අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.
(4) මහාකාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.

**35.** දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) දස වස්තුව ප්‍රතික්ෂේප කිරීමයි. (2) අටලොස් නිකාය බිහිවීමයි.
(3) දුසිල් මහණුන් සසුනින් නෙරපීමයි. (4) විනය විරෝධීව කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීමයි.

**36.** පරවාද පන්සියයක් ඛණ්ඩනය කොට සකවාද පන්සියයක් ඇතුළත් කොට මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ සම්පාදනය කළ ග්‍රන්ථය වන්නේ,
(1) ධාතුකථාප්පකරණයයි. (2) ධම්මසංගණිප්පකරණයයි.
(3) පට්ඨානප්පකරණයයි. (4) කථාවත්ථුප්පකරණයයි.

**37.** ගන්ධාර ප්‍රදේශයෙන් හමු වූ කාසියක හා ධාතු කරඬුවක බුද්ධරූප දක්නට ලැබීමෙන් පෙනී යන්නේ ග්‍රීක-රෝම කලාවේ ආභාසයෙන් බුදුපිළිම නෙළීම ආරම්භ වූ බව ය. මෙසේ බුද්ධ ප්‍රතිමාව ආරම්භ වූයේ,
(1) මෞර්ය රාජ්‍ය සමයේ ය. (2) අශෝක රාජ්‍ය සමයේ ය.
(3) කණිෂ්ක රාජ්‍ය සමයේ ය. (4) කෝසල රාජ්‍ය සමයේ ය.

**38.** ගන්ධකුටි, පාසාද, ගෙඩිගේ, ටැම්පිට විහාර යන නම්වලින් හඳුන්වා ඇත්තේ,
(1) බෝධිඝරයයි. (2) ප්‍රතිමාඝරයයි. (3) පධානඝරයයි. (4) චේතියඝරයයි.

**39.** මහියංගන ස්තූපය, කැලණි විහාර ස්තූපය, අභයගිරිය යන ස්තූපවල ආකෘති පිළිවෙළින් දැක්වෙන නිවැරදි වරණය වන්නේ,
(1) ඝණ්ටාකාර, ධාන්‍යාකාර, බුබ්බුලාකාර යන්න ය.
(2) ඝටාකාර, ඝණ්ටාකාර, බුබ්බුලාකාර යන්න ය.
(3) ඝණ්ටාකාර, ධාන්‍යාකාර, ඝටාකාර යන්න ය.
(4) ධාන්‍යාකාර, බුබ්බුලාකාර, පද්මාකාර යන්න ය.

**40.** බුදුරජාණන් වහන්සේ දෙව්ලොව සිට සංකස්සපුරයට වැඩම කිරීම සහ සස, වෙස්සන්තර, සාම ආදී ජාතක කථා චිත්‍රයට නගා ඇති පොළොන්නරු යුගයට අයත් චිත්‍ර දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
(1) දිඹුලාගල ලෙන් විහාරයයි. (2) තිවංක පිළිමගෙයයි.
(3) හිඳගල විහාරයයි. (4) දඹුලු විහාරයයි.

* *

[පස්වැනි පිටුව බලන්න.

Downloaded from 'Past Papers Wiki' - Web: www.pastpapers.wiki

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

බුද්ධ ධර්මය **I, II**
பௌத்தம் **I, II**
Buddhism **I, II**

## බුද්ධ ධර්මය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) සිදුහත් කුමරුගේ සුළු මවගේ නම කුමක් ද?
(ii) වණ්ණුපථ ජාතක කථාවෙන් හෙළිවන්නේ සිදුහත් බෝසතාණන් සම්පූර්ණ කළ කවර පාරමිතාව ද?
(iii) "මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාමය" යන ආදර්ශ පාඨය පෙරදැරි කරගෙන කටයුතු කළ රාජ්‍ය පාලකයාගේ නම කුමක් ද?
(iv) "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" මෙම පාඨයේ තේරුම ලියන්න.
(v) "තණ්හා පච්චයා උපාදානං" යන්නෙහි අර්ථය දක්වන්න.
(vi) "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච" යන ගාථාවෙන් අදහස් වන්නේ කිනම් ධර්ම කරුණක් පිළිබඳව ද?
(vii) පළමුවන හා දෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය ලබා දුන් පාලකයින් **දෙදෙනාගේ** නම් ලියන්න.
(viii) 'මනෝකම්ම' ගණයට වැටෙන අකුසල් අතුරෙන් **දෙකක්** නම් කරන්න.
(ix) 'අමාවතුර' රචනා කළ කතුවරයාගේ නම ලියන්න.
(x) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන් විසින් රචනා කරනු ලැබූ ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

**2.** (i) 'තාදී ගුණය' ධර්මානුකූලව විවරණය කරන්න.
(ii) 'තාදී ගුණය' බුද්ධ චරිතයෙන් ප්‍රකට වූ අවස්ථා **තුනකට** නිදසුන් දක්වන්න.
(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථකත්වයට පත්කර ගැනීම සඳහා 'තාදී ගුණය' අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**3.** (i) 'චාරිත්‍ර වාරිත්‍ර' (සිරිත් විරිත්) යන වචන ධර්මානුකූලව අර්ථ දක්වන්න.
(ii) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහෙන් **තුනක්** ලියා දක්වන්න.
(iii) සිල්වත් වීම පුද්ගල සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට ද ඉවහල් වන ආකාරය පහදන්න.

**4.** (i) "තං ච කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
(ii) ඉහත (i) ගාථාවේ අදහස ලියන්න.
(iii) දස කුසල් වැඩීම තුළින් සාර්ථක පුද්ගලයකු විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

**5.** (i) චතුරාර්ය සත්‍ය ධර්මවලින් **දෙකක්** නම් කරන්න.
(ii) ඉහත (i) හි නම් කළ **එක්** සත්‍යයක් කෙටියෙන් විස්තර කරන්න.
(iii) ගැටලු තේරුම්ගෙන විසඳා ගැනීමේ හොඳම මග චතුරාර්ය සත්‍ය බව පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!

**6.** (i) සතර අගතිවලට අයත් කරුණු **දෙකක්** ලියන්න.

(ii) ඉහත (i) හි සඳහන් **එක්** කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) පරමාදර්ශී පාලන තන්ත්‍රයක් උදෙසා සතර අගතියෙන් තොරවීමේ වැදගත්කම ඇගයීමට ලක් කරන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) අනගාරික ධර්මපාලතුමා.

(ii) දුමින්දාගමනය.

(iii) විචිකිච්ඡා නීවරණය.

(iv) වටදාගෙය.

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
www.LOL.LK
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න